// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2053/38 - 2018 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2018.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978 (X)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පී. වී. 62877 දරන හොරයිසන් කොලෙජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70 ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු 2017 ඔක්තෝබර් මස 04 වන දින අංක 2039/27 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ජාලකරණ සහ ජංගම පරිගණක තොරතුරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත් ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

I වන උපලේඛනය

***කොන්දේසි***

හොරයිසන් කොලෙජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩ සටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ගණිතය යන විෂයන් අතරින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

(ආ) ජෛව විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයන් අතරින් "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

1A - PG 003866 - 507 (2018/01)

මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ඈ) ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේ දී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් (ඉංග්‍රීසි ප්‍රධාන විෂය තුනෙන් එකක් විය යුතුය) "S" සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමෙ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි පාඨමාලාව* | *II වන තීරය*<br>*උපාධිය සඳහා කෙටි යෙදුම* |
|---|---|
| භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑ්ඩී ගෞරව (භෞතීය විද්‍යා) |
| ජෛව විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑ්ඩී ගෞරව (ජෛව විද්‍යා) |
| ඉංග්‍රීසි පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑ්ඩී ගෞරව (ඉංග්‍රීසි) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2018 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

01 - 741

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.